මිරුසුවිල්හි දමිළ සිවිල් වැසියන් අට දෙනෙකු ඝාතනය වීම සිදුවූයේ 2000 දෙසැම්බර් 20 වන අතර, ඉන් අනතුරුව හිටපු මාණ්ඩලික සැරයන් සුනිල් රත්නායක ඇතුළු සෙබළුන් 14 දෙනෙකු සිරභාරයට ගැනිණි. එතැන් පටන් වසර ගණනාවක් පුරාවට ඇදී ගිය මෙම නඩුවේ තීන්දුව ලැබුණේ 2015 වසරේ ජූලි 25 වන දිනයි. එහිදී වැරදි 15 කට වරදකරු වූ සුනිල් රත්නායක හට මහාධිකරණය මගින් මරණීය දණ්ඩනය ලබාදුනි. කෙසේ වෙතත් 2020 වසරේදී ඔහුට ජනාධිපති සමාව ඔස්සේ නිදහස ලැබේ.

මෙය ආවරණය කරනා ස්වාධීන රූපවාහිනී ප්‍රවෘත්ති විකාශයේදී නිවේදකයා විසින් පවසන්නේ පසුගිය රජය, රාජ්‍ය නොවන සංවිධාන සහ ඇතැම් රටවල් දෙමළ ඩයස්පෝරාව සතුටු කිරීමට ගෙන ගිය රණවිරු දඩයමේ එක් රණවිරුවෙකු ලෙස සුනිල් රත්නායකව බන්ධනාගාර ගත කෙරුණු බවයි!

සුනිල් රත්නායක සහ අනෙකුත් සෙබළුන් අත්අඩංගුවට ගන්නා විට සහ නඩු විභාගය පැවැත්වුණු අවුරුදු ගණන තුළ ලංකාවේ පැවතුණේ "පසුගිය රජය" පමණක් නොවේ. එසේ නම් ස්වාධීන රූපවාහිනී නිවේදකයා විසින් මෙය පසුගිය රජයේ රණවිරු දඩයමක් ලෙසින් චිත්‍රණය කරන්නේ කුමන පදනමකින්ද? එසේම ඒ ඔස්සේ ඔහු රටේ අධිකරණය ඔස්සේ ලබාදුන් තීන්දුවක් වලංගු නොවේ යැයි පවසන්නේද? මේ ඔස්සේ සිදුකරන්නට උත්සාහ ගැනෙන්නේ නොමග යවන සුළු මතයක් සමාජගත කිරීම නොවේද?

මූලාශ්‍ර
:- https://www.facebook.com/VRLawSL/photos/a.172400997540803/199460991501470/?type=3&theater